# වී ගොවියා මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්
## (හම්බන්තොට දිස්ත්‍රික්කය ඇසුරින් කරන ලද පර්යේෂණයකි)

ඩබ්.ජී.ආර් රුවන්ති[1]

**සංක්ෂේපය**

වී ගොවිතැන ආරම්භයේ සිට අස්වැන්න විකුණා ගැනීම දක්වා වූ විවිධ අවස්ථාවන් තුළ වී ගොවීන් විවිධ ගැටලුවලට මුහුණපාමින් සිටී. එහි වඩාත් අහිතකර ප්‍රතිඵලය වන්නේ වී ගොවීන් තම ද්‍රව්‍ය වෙනත් කාර්යය සඳහා යෙදවීම හෝ අතහැර දැමීමත් ඔවුන් වී ගොවිතැනින් ඉවත්වීමත්ය. එබැවින් මෙම අධ්‍යයන ගැටළුව වී ගොවීන්, ගොවිතැනින් ඉවත් වීම සඳහා හේතු වූයේ කිනම් සාධකද යන්න මත පදනම් වන අතර එම සාධක වඩාත් විද්‍යානුකූලව විමර්ශනය කිරීම අධ්‍යයන අරමුණ වී තිබේ. වී ගොවියා ගො ගොවිතැනෙන් ඉවත් වීමට සාධාරණ වී මිලක් නොමැති වීම හේතු වේ යන උපකල්පනය මත පදනම් වෙමින් ද මෙම පර්යේෂණය සිදු කර ඇත. 2015 වර්ෂයේ යල කන්නය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ රන්න ග්‍රාමයේ ගොවිමහතුන් 50 දෙනෙකු සසම්භාවී ලෙස තෝරා ගනිමින් ව්‍යුහගත නොවූ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේද බටඅත , අම්බලන්තොට හා නෙටොල්පිය යන ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් 2015 යල කන්නයේ ද්විතීක දත්ත මූලාශ්‍ර ඇසුරින් ද මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙලෙස ලබා ගත් දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කළ අතර අධ්‍යයන ප්‍රථිඵලවලට අනුව නියැදියෙන් බහුතරයක් කුඹුරු අක්කර 2-4 අතර හිමි වූවන් බව හෙළි විය. එසේ ම නියැදියෙන් 70%ක ප්‍රතිශතයක් අඳ ගොවියන් විය. යල කන්නයේ අස්වැද්දීම සඳහා අවශ්‍ය මුදල් බැංකු ණය හා පෞද්ගලික ණය දෙන්නන්ගෙන් ලබා ගත් පිරිස 90% ක තරම් වූ බහුතරයකි. වී අස්වැන්න සඳහා ලැබෙන මිල සාධාරණ නොවන බව අදහස් කළ පිරිස නියැදියෙන් 100%ක ප්‍රතිශතයක් වීම ගොඩනගාගත් උපන්‍යාසය තහවුරු වූ බව විද්‍යමාන කරයි. ඉහත ගැටලුවට හේතුව කෘෂි රසායන හා පොහොර මිල ඉතා ඉහළ අගයක පැවතීමත්, ගොවිජන මධ්‍යස්ථාන වලින් වී මිල දී නොගන්නා විට පෞද්ගලික ගැනුම්කරුවන්ට ඉතා අඩු මිලකට වී ලබා දීමට සිදු වීමත් ය යන පිළිතුරු නියැදියේ බහුතරයකගේ මතය විය. එසේ ම නෙටොල්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබා ගත් ද්විතීයික මූලාශ්‍ර ඇසුරින් යල කන්නයේ නෙලූ අස්වනු ප්‍රමාණයට වඩා අඩු අස්වනු ප්‍රමාණයක් එම මධ්‍යස්ථානය මඟින් මිල දී ගෙන ඇති බව අනාවරණය විය. ඒ අනුව වී අස්වනු සඳහා සාධාරණ මිලක් නොගෙවනතාක් ණය පියවා ගැනීම හෝ කිසිදු ආර්ථික වාසියක් ලබාගත නොහැකි වීම ගොවියන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු බවට හඳුනාගත හැකි විය. ඉහතින් දැක් වූ ප්‍රතිඵල මත පදනම් වීමේ දී විවිධ විෂමතාවයන් නිසා වී අස්වැන්නට සාධාරණ මිලක් නොලැබෙන බව පැහැදිලි වේ. අස්වැද්දීමේ සිට

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wgramesharuwanthi@gmail.com

අස්වනු නෙළීම තෙක් වෙහෙසකර වූ ක්‍රියාදාමයක මූලික කොටස්කරුවන් වන ගොවිජනතාවට සාධාරණ වී මිලක් ලබා දීම සේම ණය පහසුකම් ලබා දීම තුළින් ද, වී ගොවිතැන ආරක්ෂා කිරීමට හැකිවනු ඇති බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *ගොවිතැන, වී මිල, යල කන්නය*